# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/01//03(01) | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2021.06. 09 |
|---|---|---|---|---|---|

දකුණු පළාත් සභාවේ
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/පිරිස්/සැලසුම්/ඉංජිනේරු සේවා),
අමාත්‍යාංශ ලේකම් (ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර) අමාත්‍යාංශය,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය නොවූ නිලධාරීන්ගේ කාර්ය මණ්ඩල වාර්තා තුලනය කිරීම සම්බන්ධවයි.</u>**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල වාර්තාව මගින් මෙම කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 47ක් සඳහා සංවර්ධන සහකාර (සැලසුම්) තනතුරු 47ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් දෙපාර්තමේන්තුගත තනතුරක් වශයෙන් අනුමත කරවාගෙන ඇති අතර, එම තනතුර සඳහා මේ වන විට බඳවා ගැනීමේ උසස්වීම් පරිපාටියක් ද සකස් කරමින් පවතී.

02. ඒ අනුව, එම සංවර්ධන සහකාර (සැලසුම්) තනතුරු47 අතුරින් තනතුරු 16ක නිලධාරීන් දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වී ඇති බැවින්, ඔබ ආයතනය යටතේ සේවයේ නියුතු මේ දක්වා දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය නොවූ සහ අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළනොකරන ලද නිලධාරීන් හට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ස්ථාන මාරු වීමට අවස්ථාව ලබා දී ඇත.

03. එසේම, දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළකර ඇති නමුත්, පෞද්ගලික ලිපිගොනුවේ පවතින යම් යම් අඩුපාඩු හේතුවෙන් අන්තර්ග්‍රහණය සිදුකිරීම ප්‍රමාදවී ඇති නිලධාරීන් සහ අන්තර්ග්‍රහණය සඳහා පෞද්ගලික ලිපිගොනුව මා වෙත ඉදිරිපත් කර ඇති නිලධාරීන් හැර දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළනොකරන ලද නිලධාරීන් හට පමණක් මෙය අදාළ කරගත යුතුවේ.

04. බොහෝ කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩල වාර්තාව තුළ සංවර්ධන නිලධාරී තනතුර යටතේම සේවයේ යොදවා ඇති මෙම නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලයක් වෙතට යොමුකිරීම මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම තුළින් බලාපොරොත්තු වේ.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

05. ඒ අනුව, දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළනොකරන ලද හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ස්ථාන මාරු වීමට කැමති නිලධාරීන් ඇත්නම්, **මේ සමඟ අමුණා ඇති ඇමුණුම 01 ආකෘති පත්‍රය සම්පූර්ණ කර 2021.07.15 දිනට පෙර මා වෙත යොමු කරන ලෙස** කාරුණිකව දන්වා සිටිමි.

06. තවද, මේ වන විට **දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන 2021.12.31 දිනට වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් සේවයේ නියුතු සංවර්ධන සහකාර (සැලසුම්) නිලධාරීන් විසින් අනිවාර්යයෙන් ද, ස්ථාන මාරු වීමට අපේක්ෂා කරන වසර 05ට අඩු කාලයක් සේවය කරන ලද සංවර්ධන සහකාර (සැලසුම්) නිලධාරීන් විසින් ද මේ සමඟ අමුණා ඇති ඇමුණුම 01 ආකෘති පත්‍රය සම්පූර්ණ කර 2021.07.15 දිනට පෙර මා වෙත යොමු කරන ලෙස** වැඩිදුරටත් දන්වා සිටිමි.

07. එසේම, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියළුම ආයතනවල නිලධාරීන් වෙත ද මේ සම්බන්ධයෙන් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත : ලේකම්, රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා
බඳවාගත් සංවර්ධන සහකාර (සැලසුම්) නිලධාරීන්ගේ සංගමය - දැ.ගැ.ස.

ඇමුණුම 01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය නොවූ නිලධාරීන් සඳහා ස්ථාන මාරු අයදුම්පත්‍රය

| *කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා* | අයදුම්පත්‍ර අංකය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**අ) පෞද්ගලික තොරතුරු**

1. සම්පූර්ණ නම : ........................................................................................................
2. මුලකුරු සමඟ නම : ........................................................................................................
3. උපන් දිනය : ........................................................................................................
4. ජා.හැ.ප.අංකය : ........................................................................................................
5. වයස : ........................................................................................................
6. ස්ත්‍රී පුරුෂ භාවය : ........................................................................................................
7. ලිපිනය : ........................................................................................................
8. දුරකථන අංක කාර්යාලය : .................................................... පෞද්ගලික : ....................................................
9. විවාහක අවිවාහක බව : ........................................................................................................

**ආ) සේවා තොරතුරු**

10. අයත් සේවය හා ශ්‍රේණිය : ........................................................................................................
11. තනතුර : ........................................................................................................
12. වර්තමාන සේවා ස්ථානය : ........................................................................................................
13. සේවා ස්ථානය පිහිටි නගරය : ........................................................................................................
14. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කල දිනය : ........................................................................................
15. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය : අවු ........................ මාස ........................ දින ........................
16. පූර්ව සේවා ස්ථාන පිළිබඳ තොරතුරු

| සේවා ස්ථානය | සේවා කාලය | | |
|---|---|---|---|
| | සිට | දක්වා | කාලය |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |

17. ස්ථාන මාරු වීමට අපේක්ෂිත ප්‍රාදේශිය ලේකම් කාර්යාල (තම කැමැත්තේ අනුපිළිවෙලට සේවා ස්ථාන නම් කරන්න)

| සේවා ස්ථානය | පිහිටි නගරය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

18. වෙනත් කරුණු : (කෙටියෙන් සඳහන් කරන්න)

.....................................................................................................................................................................

.....................................................................................................................................................................

.....................................................................................................................................................................

.....................................................................................................................................................................

.....................................................................................................................................................................

.....................................................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවටත්, අසත්‍ය තොරතුරු වාර්තා කිරීමෙන් මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හැකි බව දන්නා බවටත් සහතික වෙමි.

............................................ ....................................

දිනය අත්සන

---

19. උක්ත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව භාර විෂය නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

.............................................................................................................. (තනතුර/සේවය) හි සේවය කරන ........................................................................................ මයා/මිය/මෙනවිය විසින් ඉහත අංක 01 සිට 16 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු , ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

විෂය භාර නිලධාරියාගේ නම : තනතුර :

අත්සන : දිනය :

---

20. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

.....................................................................................................................................................................

..............................................................................................................................................................

............................ ............................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව